# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,229—1964 නොවැම්බර් 18 වැනි බදාදා—1964.11.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනය

1946 හා 1947 ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධිනතා) රාජසභා නියෝගවල 46 (4) වැනි ඡේදයේ විධිවිධාන යටතේ, අග්‍රාමාත්‍ය සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක වන මා, මේ නිවේදනයේ සඳහන් දින සිට "පුවත්පත්" පිළිබඳ විෂය ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති වෙත මවිසින් පවරා ඇති බවත්, ඒ අනුව, ඉහත සඳහන් ඡේදය යටතේ කරනු ලැබ අංක 14,057 හා 1964 ජූනි 11 වැනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් පළකර පසුව කලින් කල සංශෝධනය කරන ලද නිවේදනය පහත සඳහන් පරිදි, එනම්:

(අ) "ප්‍රවෘත්ති හා ගුවන්විදුලි ඇමති" යන ශීර්ෂය යටතේ "විෂයයන් හා කාර්යයන්" ට අදාළ තීරයේ සඳහන් "ප්‍රවෘත්ති" යන උප ශීර්ෂය යටතේ සඳහන් කරුණුවලට පසුව "පුවත්පත්" යන උප ශීර්ෂයත්, ඒ යටතේ "පුවත්පත් පාලනය කිරීම හා ඒවා ව්‍යවස්ථාපිත රජයේ නීතිගත සංස්ථාවලට පැවරීම" යන වචන ඇතුළත් කිරීමෙන් ද;

(ආ) "අධිකරණ ඇමති" යන ශීර්ෂය යටතේ "විෂයයන් හා කාර්යයන්" ට අදාල තීරයේ සඳහන් "පුවත්පත්" යන උප ශීර්ෂයත් ඒ යටතේ වූ "පුවත්පත් පාලනය කිරීම හා ඒවා ව්‍යවස්ථාපිත රජයේ නීතිගත සංස්ථාවලට පැවරීම" යන වචන අත හැරීමෙන් ද;

තවදුරටත් සංශෝධනය කරන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැතිණිය.

අග්‍රාමාත්‍ය කාර්යාලය,
කොළඹ 1,
1964 නොවැම්බර් 18.


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1411—ආර 2187—5,565 (11/64)